
සියලු ම හිමිකම් ඇවිරිණි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2021 (2022)

60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

අ.පොෂ.ස. (සා.පෙළ) විභාගය - 2021 (2022)

60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

I පත්‍රය - ලකුණු 1 x 40 = මුළු ලකුණු 40

II පත්‍රය - ප්‍රශ්න අංකය 01 අනිවාර්ය ප්‍රශ්නයකි.
ලකුණු 20 යි

I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

ප්‍රශ්න අංක 2	-	ලකුණු	08
ප්‍රශ්න අංක 3	-	ලකුණු	08
ප්‍රශ්න අංක 4	-	ලකුණු	08

(ඕනෑම ප්‍රශ්න 02 කට)
ලකුණු 2 x 8 = 16 යි

II කොටස - ගිණුම්කරණය

ප්‍රශ්න අංක 5	-	ලකුණු	12
ප්‍රශ්න අංක 6	-	ලකුණු	12
ප්‍රශ්න අංක 7	-	ලකුණු	12

(ඕනෑම ප්‍රශ්න 2කට)
ලකුණු 2 x 12 = 24 යි

මුළු ලකුණු 60 යි

අවසාන ලකුණු ගණනය කිරීම

I පත්‍රයට මුළු ලකුණු	=	40
II පත්‍රයට මුළු ලකුණු	=	60
අවසාන ලකුණු	=	100

CamScanner

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2021 (2022)
උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පැනක් භාවිතා කළ යුතුය.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ..... √ △ 4/5

(ii) ..... √ △ 3/5

(iii) ..... √ △ 3/5

03 එකතුව → □ 10/15

ඔනුවරණ උත්තරපත්‍ර :

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.

II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.

III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.

IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.

V. විෂය අංකය හා විෂය පැහැදිලිව පෙනෙන ආකාරයට එම කොටු ද කපා ඉවත් කරන්න.

VI. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අදින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අදින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

ලකුණු ලැයිස්තු සකස් කිරීම :

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

සැ.යු :- **(I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.

***

CamScanner

අවසාන ලකුණු සකස් වන්නේ පහත පරිදි ය.

• I පත්‍රයට ලකුණු	40
• II පත්‍රයට	
පළමුවන ප්‍රශ්නයට ලකුණු	20
I කොටස - ව්‍යාපාර අධ්‍යයනය - ප්‍රශ්න 02 (02 x 08)	16
II කොටස - ගිණුම්කරණය - ප්‍රශ්න 02 (02 x 12)	24
මුළු ලකුණු	100

අනු කොටස්වලට හිමි අවසාන ලකුණු දැක්වීමේ දී පැහැදිලි ව පෙන්විය යුතු ය.

නිදසුන් : i. $\frac{2}{2}$ ii. $\frac{1}{2}$ iii. $\frac{2}{2}$ iv. $\frac{1}{2} = \frac{06}{08}$

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
II - පත්‍රය

01. ප්‍රශ්නය

(i).	ලකුණු	02
(ii).	ලකුණු	02
(iii).	ලකුණු	02
(iv).	ලකුණු	02
(v).	ලකුණු	02
(vi).	ලකුණු	02
(vii).	ලකුණු	02
(viii).	ලකුණු	02
(ix).	ලකුණු	02
(x).	ලකුණු	02

මුළු ලකුණු 20 යි

CamScanner

I - කොටස
ව්‍යාපාර අධ්‍යයනය

02. ප්‍රශ්නය

(i).	ලකුණු	02	
(ii).	ලකුණු	02	
(iii).	ලකුණු	02	
(iv).	ලකුණු	02	මුළු ලකුණු 08 යි

03. ප්‍රශ්නය

(i).	ලකුණු	02	
(ii).	ලකුණු	02	
(iii).	ලකුණු	02	
(iv).	ලකුණු	02	මුළු ලකුණු 08 යි

04. ප්‍රශ්නය

(i).	ලකුණු	02	
(ii).	ලකුණු	02	
(iii).	ලකුණු	02	
(iv).	ලකුණු	02	මුළු ලකුණු 08 යි

II - කොටස
ගිණුම්කරණය

05. ප්‍රශ්නය

(i).	ලකුණු	02	
(ii).	ලකුණු	02	
(iii).	ලකුණු	04	
(iv).	ලකුණු	04	මුළු ලකුණු 12 යි

06. ප්‍රශ්නය

(i).	ලකුණු	02	
(ii).	ලකුණු	02	
(iii).	ලකුණු	04	
(iv).	ලකුණු	04	මුළු ලකුණු 12 යි

07. ප්‍රශ්නය

(i).	ලකුණු	02	
(ii).	ලකුණු	02	
(iii).	ලකුණු	08	මුළු ලකුණු 12 යි

CamScanner

OL/2021(2022)/60-S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்

60 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය	I, II
வணிகக் கல்வியும் கணக்கீடும்	I, II
Business and Accounting Studies	I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය	- මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம்	- 10 நிமிடங்கள்
Additional Reading Time	- 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

උපදෙස්:

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දුම්බර ප්‍රාදේශීය රෝහලේ, දුම්බර පොලිස් ස්ථානයේ සහ සකසුරුවම් හා ණය සමුපකාර සමිතියේ මානව සම්පත් දායකත්වයෙන් ද ගැමුණු රබර් නිෂ්පාදන ව්‍යාපාරයේ අයිතිකරු වන ගැමුණුගේ හා මනුගේ කාර්ය මණ්ඩලයේ මූල්‍ය අනුග්‍රාහකත්වයෙන් ද 'ඩෙංගු වළක්වා ගනිමු' යන මැයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් දුම්බර මහා විද්‍යාලයේ දී පවත්වන ලදී. එම වැඩසටහනට දුම්බර මහා විද්‍යාලයේ හා මැදලන්ද විද්‍යාලයේ සිසුන්, ගුරුවරුන් හා දෙමාපියන් සහභාගි විය.

1. ඉහත සිද්ධියේ ඇතුළත් 'ඩෙංගු වළක්වා ගනිමු' යන දැනුවත් කිරීමේ වැඩසටහන මඟින් සපුරාලන මිනිස් අවශ්‍යතාව කුමක් ද?

(1) සෞඛ්‍යය (2) අධ්‍යාපනය (3) ආරක්ෂාව (4) විනෝදය

2. දුම්බර මහා විද්‍යාලයේ අභ්‍යන්තර පරිසර සාධකයක් සඳහා නිදසුනක් වන්නේ,

(1) දුම්බර මහා විද්‍යාලයේ සිසුන් හා ගුරුවරුන් ය.
(2) දුම්බර මහා විද්‍යාලයේ සිසුන් හා දෙමාපියන් ය.
(3) මැදලන්ද විද්‍යාලයේ සිසුන් හා ගුරුවරුන් ය.
(4) මැදලන්ද විද්‍යාලයේ ගුරුවරුන් හා දෙමාපියන් ය.

3. ඉහත සිද්ධියේ ඇතුළත් පෞද්ගලික අංශයේ ව්‍යාපාරයක් වන්නේ,

(1) දුම්බර ප්‍රාදේශීය රෝහල ය. (2) සකසුරුවම් සහ ණය සමුපකාර සමිතිය ය.
(3) දුම්බර මහා විද්‍යාලය ය. (4) දුම්බර පොලිස් ස්ථානය ය.

4. දුම්බර ප්‍රාදේශීය රෝහල,

(1) ඖෂධ නිෂ්පාදන ව්‍යාපාරයකි. (2) ලාභ අරමුණු කරගත් ව්‍යාපාරයකි.
(3) සේවා සපයන ව්‍යාපාරයකි. (4) පෞද්ගලික අංශයේ ව්‍යාපාරයකි.

5. ගැමුණු රබර් නිෂ්පාදන ව්‍යාපාරයේ නිෂ්පාදන සාධකයක් වන 'ව්‍යවසායකත්වය' සඳහා නිදසුනක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) නිෂ්පාදිත සඳහා භාවිත කරන රබර් (2) ව්‍යාපාරයට යොදවා ඇති මුදල්
(3) ව්‍යාපාරයේ අයිතිකරු වන ගැමුණු (4) ව්‍යාපාරයේ සේවකයින්

/දෙවැනි පිටුව බලන්න.

6. සුපුන් විදුලි පහන් නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. මෙම ව්‍යාපාරයට කර්ජනයක් වන්නේ,
(1) පුහුණු සේවකයින් ව්‍යාපාරය හැර යාම ය.
(2) සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන පහන් සඳහා ඉල්ලුම ඉහළ යාම ය.
(3) ව්‍යාපාරය ලබාගෙන ඇති බැංකු ණය මුදලේ වාරිකය නොගෙවීම ය.
(4) ව්‍යාපාරයේ මූල්‍ය වාර්තා අවිධිමත් ලෙස පවත්වාගෙන යාම ය.

7. රුවන් වෙවැල් ආශ්‍රිත නිෂ්පාදන තම නිවසේ දී නිෂ්පාදනය කර, ගෙයින් ගෙයට ගොස් අලෙවි කරයි. රුවන්,
(1) ස්ථාවර මහා පරිමාණ සිල්ලර වෙළෙන්දෙකි.
(2) ස්ථාවර සුළු පරිමාණ සිල්ලර වෙළෙන්දෙකි.
(3) සංචාරක සුළු පරිමාණ තොග වෙළෙන්දෙකි.
(4) සංචාරක සුළු පරිමාණ සිල්ලර වෙළෙන්දෙකි.

8. ව්‍යාපාර කෙරෙහි බලපාන ආර්ථික පරිසර සාධකයක් **නොවන්නේ** කුමක් ද?
(1) පොලී අනුපාතය (2) විදේශ විනිමය අනුපාතය
(3) සාක්ෂරතා අනුපාතය (4) උද්ධමන අනුපාතය

9. ගයාන් තම ඉවත් ගමන් ටිකට්පත මිල දී ගෙන ලංකා බැංකු හර පතකින් ගෙවීම් කරන ලදී. මෙම ගනුදෙනුව සිදු කිරීමට ගයාන් සතුව, ලංකා බැංකුවේ
(1) ණය පතක් තිබිය යුතු ය.
(2) කිසිදු ගිණුමක් තිබිය යුතු නැත.
(3) වියදම් කළ මුදලට සමාන ශේෂයක් සහිත ස්ථාවර තැන්පතුවක් තිබිය යුතු ය.
(4) වියදම් කළ මුදලට සමාන ශේෂයක් සහිත ඉතිරි කිරීමේ ගිණුමක් තිබිය යුතු ය.

10. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ ක්‍රියාත්මකවන බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වන්නේ,
(1) රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවයි. (2) ජාතික ඉතිරි කිරීමේ බැංකුවයි.
(3) සණස සංවර්ධන බැංකුවයි. (4) මහජන බැංකුවයි.

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක 11 හා 12 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පියල් කුලී ත්‍රී රෝද රථයක ගමන් කරමින් සිටිය දී රථය අනතුරකට භාජනය වී ඔහු සුළු තුවාල ලබයි. එම අවස්ථාවේ දී ම ත්‍රී රෝද රථය පැද වූ හිමිකරු විසින් ත්‍රී රෝද රථය රක්ෂණය කර තිබූ සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සමාගමට මෙම අනතුර පිළිබඳව ජංගම දුරකථනයෙන් කෙටි පණිවිඩයක් මගින් දැනුම් දෙන ලදී.

11. ඉහත සිද්ධියට අනුව රක්ෂණයට සම්බන්ධ පළමු පක්ෂය, දෙවන පක්ෂය හා තෙවන පක්ෂය පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) පියල්, ත්‍රී රෝද රථ හිමිකරු හා සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සමාගම
(2) සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සමාගම, පියල් හා ත්‍රී රෝද රථ හිමිකරු
(3) ත්‍රී රෝද රථ හිමිකරු, සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සමාගම හා පියල්
(4) ත්‍රී රෝද රථ හිමිකරු, පියල් හා සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සමාගම

12. ඉහත සිද්ධියට අදාළ අනතුර වාර්තා කිරීම සඳහා ත්‍රී රෝද රථ හිමිකරු භාවිත කළ කෙටි පණිවිඩය අයත්වන සන්නිවේදන මාධ්‍ය කුමක් ද?
(1) විද්‍යුත් වාචික (2) විද්‍යුත් ලිඛිත (3) සංඥා ලිඛිත (4) විද්‍යුත් සංඥා

13. ප්‍රවාහන මූලිකාංග සහ ඒවාට අදාළ නිදසුන් පහත වගුවේ දැක්වේ.

ප්‍රවාහන මූලිකාංග	ප්‍රවාහන මූලිකාංග සඳහා නිදසුන්
1. මාර්ගය	A - නවීන පහසුකම් සහිත ඉන්ධන පිරවුම් හලක් විවෘත කිරීම
2. මාධ්‍යය	B - මිරිගම සිට කුරුණෑගල දක්වා අධිවේගී මාර්ගය විවෘත කිරීම
3. බලය	C - යාපනයේ නව දුම්රිය ස්ථානයක් පිහිටුවීම
4. පර්යන්තය	D - ගල්කිස්ස සිට කන්කසන්තුරය දක්වා සුඛෝපභෝගී දුම්රියක් යෙදවීම

ඉහත දී ඇති ප්‍රවාහන මූලිකාංග අනුපිළිවෙළ අනුව, නිදසුන් නිවැරදිව ගළපන ලද පිළිතුර තෝරන්න.
(1) B, D, A, C (2) B, D, C, A (3) D, B, A, C (4) D, C, A, B

/තුන්වැනි පිටුව බලන්න.

14. විකුණුම් කළමනාකරු විසින් 2021 වර්ෂයේ විකුණුම් ඇගයීමට ලක් කිරීම කළමනාකරණ ක්‍රියාවලියේ ① ② ට අයත් වන අතර, 2022 වර්ෂයේ දී 5% ක වර්ධනයකට යටත් ව තාණ්ඩ විකිණීම, අලෙවිකරණ මිනුමේ විචල්‍යයට අයත් වේ.

ඉහත ① හා ② යන ස්ථානවලට අදාළ නිවැරදි පෙළුම පිළිතුරෙන් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) පාලනය, ප්‍රවර්ධනය
(2) සැලසුම්කරණය, මිල
(3) සැලසුම්කරණය, ප්‍රවර්ධනය
(4) පාලනය, මිල

15. රංග විසින් උපයාගත් රු. 250 000 ක මුදල් සීමාසහිත පොදු සමාගමක සාමාන්‍ය කොටස්වල ආයෝජනය කළේ ය. 2021 වර්ෂයේ එම සමාගම ඉපැයූ ලාභයෙන් රු. 10 000 ක මසුට හිමි විය. පසුව සියලු කොටස් රු. 350 000 කට විකුණන ලදී. මෙම ආයෝජනයෙන් රංග උපයාගත් ප්‍රතිලාභ හැඳින්වෙන පෙළුම දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) පොලී ආදායම්, ලාභාංශ
(2) ලාභාංශ, ප්‍රාග්ධන ලාභ
(3) ලාභ, ප්‍රාග්ධන ලාභ
(4) ප්‍රාග්ධන ලාභ, පොලී ආදායම්

16. නිශ්චිත ප්‍රතිලාභ අනුපාතයක් රහිත ආයෝජන මාර්ගය කුමක් ද?

(1) ස්ථාවර තැන්පතු
(2) භාණ්ඩාගාර බිල්පත්
(3) ඉසිරිසිරිමම් තැන්පතු
(4) සමාගම් කොටස්

17. දිවිත්ව සටහන් මූලධර්මය අනුව අඩුවීම් හර, වැඩිවීම් බැර ලෙස සටහන් කෙරෙන ගිණුම් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ණයකරු ගිණුම, තැබිලි ගිණුම, විකුණුම් ගිණුම, රක්ෂණ යාඥා ගිණුම
(2) බැංකු ණය ගිණුම, ණයකරු ගිණුම, දුන් වට්ටම් ගිණුම, කොමිස් ආදායම් ගිණුම
(3) වැටුප් ගිණුම, ණයකැති ගිණුම, වේතන ගිණුම, මුදල් ගිණුම
(4) ප්‍රාග්ධන ගිණුම, ණයකරු ගිණුම, බැංකු ණය ගිණුම, ලද වට්ටම් ගිණුම

18. ටී බඩු නිෂ්පාදන ව්‍යාපාරයක ඵලයම නොවන වත්කමක් වන්නේ,

(1) ලැබිය යුතු හෙවණැලි කුලී ය.
(2) විකිණීමට තබා ඇති ටී බඩු ය.
(3) වඩු මේසය ය.
(4) අතැති මුදල් ය.

● පහත තොරතුරු ඇසුරෙන් අංක 19 සිට 21 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ව්‍යාපාරයක සිදු වූ හුදෙකලා සිදුවීම්වල කිහිපයක් පහත දැක්වේ.

A – රු. 25 000 ක බඩු තොගයක් අත්හිට මුදලට මැනීම
B – රු. 10 000 කට මිල දී යන් බඩු තොගයක් රු. 12 000 ට ණයට විකිණීම
C – ණයකැතියකුගෙන් රු. 5 000 ක මුදලක් ලැබීම
D – ව්‍යාපාරයේ කාර්යාලයට රු. 50 000 ක මේසයක් ණයට මැනීම

19. ඉහත හුදෙකලා අතුරෙන් ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයෙහි හිමිකම් කෙරෙහි බලපාන හුදෙකලාව වන්නේ,

(1) A ය.
(2) B ය.
(3) C ය.
(4) D ය.

20. ඉහත හුදෙකලාවලින් පසු මෙම ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයෙහි වත්කම්වල අගය වැඩි වන්නේ

(1) රු. 15 000 කිනි.
(2) රු. 17 000 කිනි.
(3) රු. 52 000 කිනි.
(4) රු. 92 000 කිනි.

21. ඉහත හුදෙකලාවලට පෙර මෙම ව්‍යාපාරයේ මුළු වගකීම් රු. 80 000 ක් වූයේ නම්, මෙම හුදෙකලාවලින් පසු මුළු වගකීම්වල අගය කොපමණ ද?

(1) රු. 75 000
(2) රු. 90 000
(3) රු. 130 000
(4) රු. 142 000

22. භාවිත කළ කාර් රථ මිල දී ගෙන විකුණන ව්‍යාපාරයක්, රු. 2 000 000 කට කාර් රථයක් විකිණීම සඳහා ණයට ගැනීම සටහන් කෙරෙන මූලාශ්‍ර ලේඛනය හා මූලික සටහන් පොත පිළිවෙළින්,

(1) ගෙවීම් වවුචරය සහ ගැනුම් ඒජාතලයයි.
(2) ඒජාතල් වවුචරය සහ පොදු ඒජාතලයයි.
(3) ගැනුම් ඉන්වොයිසිය සහ පොදු ඒජාතලයයි.
(4) ගැනුම් ඉන්වොයිසිය සහ ගැනුම් ඒජාතලයයි.

23. ණයකැතියකු වූ රවීගෙන් ලැබුණු රු. 15 000 ක චෙක්පත, ව්‍යාපාරයේ ලෙජරයේ සටහන් කර ඇත. එම චෙක්පත බැංකු ගිණුමේ තැන්පත් කරන විට කැමිය යුතු නිවැරදි දිවිත්ව සටහන වන්නේ,

(1) බැංකු ගිණුම හර රු. 15 000
මුදල් ගිණුම බැර රු. 15 000
(2) බැංකු ගිණුම හර රු. 15 000
රවීගේ ගිණුම බැර රු. 15 000
(3) මුදල් ගිණුම හර රු. 15 000
බැංකු ගිණුම බැර රු. 15 000
(4) මුදල් ගිණුම හර රු. 15 000
රවීගේ ගිණුම බැර රු. 15 000

[සතරවැනි පිටුව බලන්න.

24. ව්‍යාපාරයක සුළු මුදල් අග්‍රිමය රු. 5 000 කි. 2022.01.31 දිනට මෙම ව්‍යාපාරයේ සුළු මුදල් පොතේ ශේෂය රු. 800 ක් විය. එදින ලෙජරයට මාරු කළ, සුළු මුදල් පොතේ වියදම් තීරුවල මුළු එකතුව

(1) රු. 800 කි. (2) රු. 4 200 කි. (3) රු. 5 000 කි. (4) රු. 5 800 කි.

25. ජර්නල් වවුචරය මූලාශ්‍ර ලේඛනයක් ලෙස භාවිත කරන ගනුදෙනුව කුමක් ද?

(1) විකිණීම සඳහා රු. 10 000 ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම
(2) ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 50 000 ක ලී බඩු අත්පිට මුදලට ගැනීම
(3) ව්‍යාපාරයට රු. 200 000 ක ණය මුදලක් මූල්‍ය ආයතනයකින් ලබා ගැනීම
(4) අයිතිකරු තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ව්‍යාපාරයෙන් රු. 5 000 ක භාණ්ඩ තොගයක් ලබා ගැනීම

26. සඳුන් තම පුතු කසුන්ගේ පන්ති ගාස්තු රු. 2 000 ක් ව්‍යාපාරයේ චෙක්පතකින් ගෙවන ලදී. මෙම ගනුදෙනුව සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන කුමක් ද?

(1)
ගැනිලි ගිණුම	හර	රු. 2 000
බැංකු ගිණුම	බැර	රු. 2 000

(2)
ගැනිලි ගිණුම	හර	රු. 2 000
මුදල් ගිණුම	බැර	රු. 2 000

(3)
කසුන්ගේ ගිණුම	හර	රු. 2 000
බැංකු ගිණුම	බැර	රු. 2 000

(4)
කසුන්ගේ ගිණුම	හර	රු. 2 000
මුදල් ගිණුම	බැර	රු. 2 000

27. අමල්ගේ ව්‍යාපාරයේ 2022.03.31 දිනට බැංකු ගිණුමේ ශේෂය, එදිනට බැංකු ප්‍රකාශයේ ශේෂයට වඩා අඩුවීමට හේතුවක් වන්නේ

(1) 2022.03.30 දින බැංකුවේ තැන්පත් කළ රු. 15 000 ක චෙක්පත නිශ්කාෂණය නොවීම ය.
(2) 2022.03.29 දින රුවන්ට නිකුත් කළ රු. 25 000 ක චෙක්පත බැංකුවට ඉදිරිපත් නොකිරීම ය.
(3) ස්ථාවර නියෝග මත බැංකුව රු. 1 000 ක මාර්තු මාසයේ රක්ෂණ ගාස්තුව ගෙවීම ය.
(4) බැංකුව මාර්තු මාසය සඳහා රු. 1 500 ක බැංකු ගාස්තුවක් අයකර තිබීම ය.

28. ව්‍යාපාරයක ගිණුම් වර්ෂයක් අවසානයේ දී පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමකින් අනාවරණය නොවන වරද දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) රු. 1 500 ක අත්පිට ගැනුම් මුදල් පොතේ පමණක් සටහන් වීම
(2) ණයහිමියකුට මුදල් ගෙවීමේ දී ලැබුණු රු. 500 ක වට්ටම, ලද වට්ටම් ගිණුමේ සටහන් නොවීම
(3) රු. 55 000 ක ණයට ගැනුම්, ගැනුම් ජර්නලයේ නිවැරදි ව සටහන් කර, අදාළ ණයහිමි ගිණුමට රු. 50 000 ක් ලෙස බැර කිරීම
(4) ගෙවූ රක්ෂණ ගාස්තු රු. 1 500 මුදල් පොතේ නිවැරදිව සටහන් කර වරිපනම් ගාස්තු ගිණුමට හර කර තිබීම

29. ව්‍යාපාරයක රු. 9 000 ක දුරකථන ගාස්තු ගෙවීම, දුරකථන ගාස්තු ගිණුමට හර කර ඇත්තේ රු. 900 ක් ලෙස ය. මෙම වරද නිවැරදි කිරීමට අදාළ ජර්නල් සටහන තෝරන්න.

(1)
දුරකථන ගාස්තු ගිණුම	හර	රු. 8 100
මුදල් ගිණුම		රු. 8 100

(2)
දුරකථන ගාස්තු ගිණුම	හර	රු. 8 100
අවිනිශ්චිත ගිණුම		රු. 8 100

(3)
දුරකථන ගාස්තු ගිණුම	හර	රු. 9 000
අවිනිශ්චිත ගිණුම		රු. 9 000

(4)
දුරකථන ගාස්තු ගිණුම	හර	රු. 9 000
මුදල් ගිණුම		රු. 9 000

පසුපැති පිටුව බලන්න.

● පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක **35** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කුසල්ගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට ශේෂ පිරික්සුම් පහත දැක්වේ.

	හර (රු.)	බැර (රු.)
විකුණුම්		450 000
ගැනුම්	200 000	
2021.01.01 දිනට තොගය	100 000	
මෝටර් රථ (පිරිවැයට)	800 000	
10% බැංකු ණය		100 000
මුදල් ශේෂය	15 000	
රක්ෂණ ගාස්තු	7 000	
ලද ගෙවල් කුලී		3 000
සේවක වැටුප්	12 000	
2021.01.01 දිනට ප්‍රාග්ධනය		600 000
ණයගැතියෝ	46 000	
ණයහිමියෝ		35 000
බැංකු ණය පොලී	8 000	
	1 188 000	1 188 000

අතිරේක තොරතුරු :

1. 2021.12.31 දිනට ඉතිරි තොගය රු. 80 000 කි.
2. 2021.12.31 දිනට ණයගැතියන්ගෙන් රු. 4 000 ක් බොල් ණය ලෙස කපාහැරිය යුතු ය.
3. 2021.12.31 දිනට ලැබිය යුතු ගෙවල් කුලී රු. 2 000 කි.

35. කුසල්ගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය

(1) රු. 150 000 කි. (2) රු. 220 000 කි. (3) රු. 300 000 කි. (4) රු. 380 000 කි.

36. කුසල්ගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂයේ දළ ලාභය

(1) රු. 70 000 කි. (2) රු. 150 000 කි. (3) රු. 230 000 කි. (4) රු. 300 000 කි.

37. කුසල්ගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය

(1) රු. 200 000 කි.. (2) රු. 202 000 කි. (3) රු. 204 000 කි. (4) රු. 206 000 කි.

38. කුසල්ගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට මුළු වගකීම්වල වටිනාකම

(1) රු. 37 000 කි. (2) රු. 100 000 කි. (3) රු. 135 000 කි. (4) රු. 137 000 කි.

39. කුසල්ගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට මුළු වත්කම්වල වටිනාකම

(1) රු. 937 000 කි. (2) රු. 939 000 කි. (3) රු. 941 000 කි. (4) රු. 943 000 කි.

40. කුසල්ගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට හිමිකම

(1) රු. 202 000 කි. (2) රු. 600 000 කි. (3) රු. 802 000 කි. (4) රු. 804 000 කි.

* *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2021 (2022)
க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2021 (2022)

විෂය අංකය
பாட இலக்கம் **60**

විෂයය
பாடம் **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

I පත්‍රය - පිළිතුරු
I பத்திரம் - விடைகள்

ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.
01.	2	11.	3	21.	3	31.	2
02.	1	12.	2	22. Bonus	4	32.	4
03.	2	13.	1	23.	1	33.	1
04.	3	14.	4	24.	2	34.	1
05.	3	15.	2	25.	4	35.	2
06.	2	16.	4	26.	1	36.	3
07.	4	17.	4	27.	2	37.	2
08.	3	18.	3	28.	4	38.	4
09.	4	19.	2	29.	2	39.	2
10.	4	20.	3	30.	4	40.	3

විශේෂ උපදෙස්
විசேட அறிவுறுத்தல்
} එක් පිළිතුරකට ලකුණු
ஒரு சரியான விடைக்கு **01** බැගින්
புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව
சரியான விடைகளின் தொகை

25
40

I පත්‍රයේ මුළු ලකුණු
பத்திரம் I இன் மொத்தப்புள்ளி

25
40

අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2021 (2022)

60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

II පත්‍රය

ලකුණු දීමේ පටිපාටිය

1. පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කළමනාකරණ උපාධිධාරියකු වූ අවදානම් දැරීමට කැමති සුභවාදී අදහස් දරන දිවාන්, සංචාරක පාරාදීසයක් වූ කොග්ගල ග්‍රාමයේ වාසය කරයි. ඔහු මඩොල්දූව නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ට කොග්ගල වැව හරහා මඩොල්දූවට යාම සඳහා බෝට්ටු සේවා සැපයීමට 'ගඟුලි සෆාරි' නමින් ව්‍යාපාරයක්, තමා සතු රු. 800 000 ක මුදල් ද, වාර්ෂිකව 12%ක පොලියට රු. 500 000 ක බැංකු ණයක් ද යොදවා 2022.01.01 දින ආරම්භ කළේ ය. එදින ම ඔහු රු. 800 000 කට සෆාරි බෝට්ටුවක් ද රු. 120 000 කට ආරක්ෂිත ඇඳුම් කට්ටල ද අත්පිට මුදලට ගත් අතර, රු. 35 000 ක මාසික වැටුපකට පළපුරුදු බෝට්ටු රියදුරකු වූ තිලක් ද, රු. 10 000 ක මාසික වැටුපකට නුපුහුණු සේවකයකු වූ කුමාර ද බඳවා ගත්තේ ය. එදින ම සංචාරක නිකේතන බහුලව පිහිටි මඩොල්දූවට ඉතා නුදුරින් ව්‍යාපාරික ස්ථානය සඳහා ගොඩනැගිල්ලක් මසකට රු. 7 000 ක කුලී පදනම මත ලබා ගන්නා ලදී.

2022.01.31 දිනෙන් අවසන් මාසය තුළ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

	රු.
• ගෙවූ ඉන්ධන වියදම්	85 000
• ගෙවූ රක්ෂණ ගාස්තු	8 000
• ගෙවූ නොවුපළ ගාස්තු	15 000
• ගෙවූ වෙනත් වියදම්	20 000
• ලැබූ මුළු බෝට්ටු සේවා ආදායම	310 000

ජනවාරි මාසයේ ව්‍යාපාරයේ ආදායම් හා වියදම් විශ්ලේෂණය කිරීමෙන් පසු, පෙබරවාරි මාසයේ සිට තවත් සෆාරි බෝට්ටු දෙකක් ණය පදනම මත ලබාගෙන ව්‍යාපාරය තවදුරටත් පුළුල් කිරීමට දිවාන් තීරණය කර ඇත.

අමතර තොරතුරු :

- සෆාරි බෝට්ටුව වාර්ෂිකව 12% බැගින් සහ ආරක්ෂක ඇඳුම් කට්ටල වාර්ෂිකව 50% බැගින් ක්ෂය කළ යුතු ය.
- ජනවාරි මාසයේ විදුලි බිල රු. 1 000 කි. එය 2022.01.31 දින වන විටත් ගෙවා නොමැත.
- ජනවාරි මාසයට අදාළ, බෝට්ටු රියදුරු සහ නුපුහුණු සේවක වැටුප ජනවාරි මාසය තුළ දී ගෙවා ඇති අතර, ගොඩනැගිලි කුලිය 2022.01.31 දින තෙක් ගෙවා නොමැත.

(i) (අ) 'ගඟුලි සෆාරි' ව්‍යාපාරය මගින් සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාව කුමක් ද?

(ආ) ව්‍යාපාර හිමිකාරත්වය අනුව 'ගඟුලි සෆාරි' ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(ii) 'ගඟුලි සෆාරි' ව්‍යාපාරයේ, ව්‍යාපාර පරිසර සාධක පහක් පහත දැක්වේ.

(අ) කොග්ගල සංචාරක පාරාදීසය

(ආ) දිවාන්ගේ කළමනාකරණ උපාධිය

(ඉ) පළපුරුදු බෝට්ටු රියදුරු, තිලක්

(ඊ) නුපුහුණු සේවක, කුමාර

(උ) ව්‍යාපාර ස්ථානයට නුදුරින් පිහිටි මඩොල්දූව

ඉහත එක් එක් ව්‍යාපාර පරිසර සාධකය 'ගඟුලි සෆාරි' ව්‍යාපාරයට ශක්තියක් ද, දුර්වලතාවක් ද, අවස්ථාවක් ද, තර්ජනයක් ද යන්න දක්වන්න. (පිළිතුරු ලිවීම සඳහා පහත ආකාරයේ වගුවක් භාවිත කරන්න. පළමු පරිසර සාධකය (අ) සඳහා පිළිතුර දී ඇත.)

වාපාර පරිසර සාධකය	
(අ)	අවස්ථාවකි
(ආ)	
(ඉ)	
(ඊ)	
(උ)	

(iii) 'ගඟුලි සෆාරි' ව්‍යාපාරය ඇසුරෙන් පහත සඳහන් කළමනාකරණ කාර්ය සඳහා නිදසුන බැගින් ලියන්න.
(අ) සංවිධානකරණය (ආ) පාලනය

(iv) 'ගඟුලි සෆාරි' ව්‍යාපාරය විසින් සපයනු ලබන සේවාවට අදාළව පහත නිෂ්පාදන සාධක සඳහා නිදසුන බැගින් ලියන්න.

(අ) භූමිය (ආ) ශ්‍රමය (ඉ) ප්‍රාග්ධනය (ඊ) ව්‍යවසායකත්වය

(v) (අ) 2022.01.01 දිනට 'ගඟුලි සෆාරි' ව්‍යාපාරයේ හිමිකම සහ වගකීම්වල වටිනාකම් වෙන වෙන ම ලියන්න.
(ආ) 2022.01.01 දිනට 'ගඟුලි සෆාරි' ව්‍යාපාරය සතු වත්කම් දෙකක් වටිනාකම් සහිතව ලියන්න.

(vi) (අ) 2022.01.31 දිනට 'ගඟුලි සෆාරි' ව්‍යාපාරයේ උපචිත විදුලිය රු. 1 000 සටහන් කිරීමට අදාළ මූලාග්‍ර ලේඛනය සහ මූලික පොත සඳහන් කරන්න,
(ආ) 'ගඟුලි සෆාරි' ව්‍යාපාරය රු. 120 000 කට ආරක්ෂිත ඇඳුම් කට්ටල අත්පිට මුදලට ගැනීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.

(vii) 2022.01.31 දිනට 'ගඟුලි සෆාරි' ව්‍යාපාරයේ එක් එක් ජංගම නොවන වත්කමේ ශුද්ධ අගය වෙන වෙන ම දක්වන්න.

(viii) 2022.01.31 දිනට 'ගඟුලි සෆාරි' ව්‍යාපාරයේ මුදල් ශේෂය ගණනය කරන්න.

(ix) 2022.01.31 දිනෙන් අවසන් මාසය සඳහා 'ගඟුලි සෆාරි' ව්‍යාපාරයේ ශුද්ධ ලාභය හෝ අලාභය ගණනය කර දක්වන්න.

(x) 'ගඟුලි සෆාරි' ව්‍යාපාරයේ,
(අ) 2022.01.31 දිනට හිමිකම කොපමණ ද?
(ආ) 2022.01.31 දිනට මුළු වත්කම්වල වටිනාකම කොපමණ ද? **(ලකුණු 02 × 10 = 20 යි)**

1. (i) (අ) ප්‍රවාහනය **(ලකුණු 01 යි)**

(ආ) පෞද්ගලික අංශයේ ව්‍යාපාරයකි., නෝවල ඇවාම් නෑ පුද්ගල. **(ලකුණු 01 යි)**

(ii)

ව්‍යාපාර පරිසර සාධකය	
(අ)	-
(ආ)	ශක්තියකි
(ඉ)	ශක්තියකි
(ඊ)	දුර්වලතාවකි
(උ)	අවස්ථාවකි

(½ × 04 - ලකුණු 02 යි)

(iii) (අ) **සංවිධානකරණය**

- ප්‍රාග්ධනය යෙදවීම
- බැංකු ණය ලබා ගැනීම
- සහාරි බෝට්ටුවක් මිල දී ගැනීම
- ආරක්ෂිත ඇදුම් කට්ටල මිල දී ගැනීම
- පළපුරුදු බෝට්ටු රියැදුරකු බඳවා ගැනීම
- නුපුහුණු සේවකයෙකු බඳවා ගැනීම
- ගොඩනැගිල්ලක් කුලියට ගැනීම

(ඔනෑම කරුණු එකකට ලකුණු 01 යි)

(ආ) පාලනය - ජනවාරි මාසයේ ආදායම් වියදම් විශ්ලේෂණය කිරීම

(ලකුණු 01 යි)

(iv) (අ) භූමිය - කොග්ගල වැව , වල්ලය , ~~අතෙ වල්ලය~~ දැවේ වල්ලය නම් ½

(ආ) ශ්‍රමය - බෝට්ටු රියැදුරු - තිලක් නම් දෙන සමාන නිවැරදියක් ඉඩ
- නුපුහුණු සේවක - කුමාර ½

(ඉ) ප්‍රාග්ධනය
- මුදල්
- සහාරි බෝට්ටුව
- ආරක්ෂිත ඇදුම් කට්ටල ½
- ~~කුලි ගොඩනැගිල්ල~~
- ඉන්ධන

(ඊ) ව්‍යවසායකත්වය - අවදානම් දැරීමට කැමති සුභවාදී අදහස් දරන දිවාන් නම සමාන නිවැරදි ඉඩ. ½
නුසිහාරු නිවැරදි ලෙස ලියා ඇති.
(½ x 04 - ලකුණු 02 යි)

(v) (අ) 2022.01.01 දිනට

හිමිකම - රු. 800 000 ½

වගකීම - රු. 500 000 ½

(½ x 02 - ලකුණු 01 යි)

(අ) වත්කම්

සෘණාරි බෝට්ටුව	-	රු. 800 000
ආරක්ෂිත ඇදුම් කට්ටල	-	රු. 120 000
මුදල්	-	රු. 380 000

* වටිනාකම් ඌනය වේ.

(½ x 02 - ලකුණු 01 යි)

(vi) (අ) මූලාග්‍ර ලේඛනය - ජර්නල් වවුචරය

මූලික පොත - පොදු ජර්නලය

(½ x 02 - ලකුණු 01 යි)

(ආ) ආරක්ෂිත ඇදුම් කට්ටල ගිණුම හර - රු. 120 000

මුදල් ගිණුම බැර - රු. 120 000

(ලකුණු 01 යි)

(vii)

සෘණාරි බෝට්ටුව	-	රු. 792 000
ආරක්ෂිත ඇදුම් කට්ටල	-	රු. 115 000

නම ඌනයයි.

රු. 8 ය, 000 – 8, 000 නිවැරදියි 1/2

(01 x 02 - ලකුණු 02 යි)

(viii)

මුදල් පොත

දිනය	ලි. අ	විස්තරය	ස. පි.	වටිනාකම රු.	දිනය	ව. අ	විස්තරය	ස. පි	වටිනාකම රු.
		ප්‍රාග්ධනය		800 000			සෘණාරි බෝට්ටු		800 000
		බැංකු ණය		500 000			ආරක්ෂිත ඇදුම් කට්ටල		120 000
		සේවා ආදායම්		310 000			ඉන්ධන		85 000
							රක්ෂණ ගාස්තු		8 000
							තොටුපල ගාස්තු		15 000
							මෙනත් වියදම්		20 000
							රියදුරු වැටුප්		35 000
							සේවක වැටුප්		10 000
							ශේෂය ප/ගෙ		517 000
				1 610 000					1 610 000

මුදල් ශේෂය රු. 517 000/=

(ලැබීම් අයිතම 3 සඳහා ලකුණු ½ යි)

(ගෙවීම් අයිතම 8 ට ලකුණු 01 යි)

(නිවැරදි මුදල් ශේෂයට ලකුණු ½ යි)

මෝල් නැතිව ඌනයය නෑ (අනාත්‍ය)

එවන නෑව අදි වාලට ගුලිනම් ලියා ඇත්නම් ලකුණු දෙන්න.

(ix)

ශුද්ධ ලාභය ගණනය කිරීමේ ලේඛනය

		(රු.)	(රු.)
සේවා ආදායම			310 000
අඩු කළා - වියදම්			
බැංකු ණය පොළිය	★	5 000	
රියදුරු වැටුප්		35 000	
සේවක වැටුප්		10 000	
ගොඩනැගිලි කුලි		7 000	
ඉන්ධන වියදම		85 000	
රක්ෂණ ගාස්තු		8 000	
තොටුපල ගාස්තු		15 000	
වෙනත් වියදම්		20 000	
බෝට්ටු ක්ෂය	★	8 000	
ආරක්ෂිත ඇදුම් කට්ටල ක්ෂය	★	5 000	
විදුලිය ගාස්තු	★	1 000	(199 000)
ශුද්ධ ලාභය			**111 000**

8000 + 5000 කෑල්ල ඉවත්
13,000 නම් 1/2

(★ 4 සඳහා ලකුණු 01 යි)

(නිවැරදි ශුද්ධ ලාභයට ලකුණු 01 යි)

(x)

(අ) 2022.01.31 දිනට හිමිකම = රු. 911 000

හෝ

(01)

= රු. 800 000 + 111 000

(ලැයිස්තුගත කිරීම)

(ලකුණු 01 යි)

(ආ) 2022.01.31 දිනට මුළු වත්කම = රු. 1 424 000

ඇතිරි 792 000
හැකිලෙන 115 000
මුදල් 517 000

(ලකුණු 01 යි)

01	(i)	(ii)	(iii)	(iv)	(v)	(vi)	(vii)	(viii)	(ix)	(x)	$\frac{20}{20}$
	02	02	02	02	02	02	02	02	02	02	

I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

2. (i) සමූපකාර සමිතිවල දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) මිනිස් අවශ්‍යතා නිසඟයෙන් බිහිවන අතර වුවමනා නිර්මාණය කළ හැකි ය.

(ආ) ව්‍යාපාරයක තරඟකරුවන් එහි අභ්‍යන්තර පරිසර සාධකයකි.

(ඉ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සේවා සැපයීමේ ව්‍යාපාරයකි.

(ඊ) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ගේ වගකීම සීමිත වේ. (ලකුණු 02 යි)

(iii) සමන් තම පියා සමඟ පාසලේ සිට නිවස වෙත යන අතරේ දී සිදු වූ සිදුවීම් දෙකක් පහත දැක්වේ.

1. පියා, සුපුදු පොත් අලෙවිසැලෙන් සමන්ට සිතියම් පොතක් මිල දී ගැනීම
2. පියා, සීමාසහිත ලංකා සතොසෙන් හාල් කිලෝග්‍රෑම් පහක් මිලට ගැනීම

ඉහත එක් එක් සිද්ධිය තුළින් සපුරා ගනු ලැබූ මිනිස් අවශ්‍යතාව සහ එම අවශ්‍යතාව සපුරාලීමට අදාළ වූ ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය (අරමුණු අනුව) සඳහන් කරන්න. (පිළිතුරු සැපයීම සඳහා පහත ආකාරයේ වගුවක් භාවිත කරන්න.)

සිද්ධිය	සපුරා ගනු ලැබූ මිනිස් අවශ්‍යතාව	අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය (අරමුණු අනුව)
1		
2		

(ලකුණු 02 යි)

(iv) නයනා විසින් නුවරඑළියේ මල් වගා කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් 'සකුරා මල්' නමින් සාර්ථකව පවත්වාගෙන යන අතර, පසුගිය වසරේ ඇති වූ දිලීර රෝගයක් නිසා ග්‍රාමීය බැංකු ණය වාරිකය ගෙවීමේ අපහසුතාවකට පත් විය. නමුත් ඇයගේ ව්‍යාපාර දැනුම, කැපවීම සහ කාබනික පොහොර ලබා දෙමින් රජය කළ දිරිගැන්වීම් නිසා ඇය මෙම වසරේ සාර්ථක විය.

(අ) ඉහත සිද්ධියේ සඳහන් වන 'සකුරා මල්' ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශ්ව **දෙකක්** ලියන්න.

(ආ) ඉහත සිද්ධියේ සඳහන් 'සකුරා මල්' ව්‍යාපාරයේ නාමය ලියාපදිංචි කිරීමට හේතුව ලියන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 08 යි)

2. (i)

- ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම
- ස්වේච්ඡා හා විවෘත සාමාජිකත්වය
- සාමාජිකයන්ගේ සාමූහික අයිතිය
- පොදු අවශ්‍යතා හා අරමුණුවලින් යුක්ත වීම

(01 x 02 - ලකුණු 02 යි)

(ii) (අ) සත්‍යයි ✓

(ආ) අසත්‍යයි ×

(ඉ) සත්‍යයි ✓

(ඊ) අසත්‍යයි ×

(½ x 04 - ලකුණු 02 යි)

(iii)

සිද්ධිය	සපුරාගතු ලැබූ මිනිස් අවශ්‍යතාව	අරමුණ අනුව අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය
1	අධ්‍යාපනය	ලාභ අරමුණු කරගත්
2	ආහාර	ලාභ අරමුණු කර නොගත්

(½ × 04 - ලකුණු 02 යි)

(iv) (අ) අයිතිකරු / නයනා
මූල්‍ය ආයතන / ග්‍රාමීය බැංකුව
රජය

(½ × 02 - ලකුණු 01 යි)

(ආ) 'සකුරා මල්' ව්‍යාපාර නාමය, නයනාගේ සම්පූර්ණ නාමය නොවන නිසා
(ලකුණු 01 යි)

02	(i)	(ii)				(iii)		(iv)		08/08
		අ	ආ	ඉ	ඊ	1	2	අ	ආ	
	02	½	½	½	½	01	01	01	01	

3. (i) ජංගම ගිණුමක් පවත්වාගෙන යාමේ වාසි දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
(අ) චෙක්පත් මගින් ගනුදෙනු කිරීමේ දී රේඛනය කිරීම අනිවාර්ය වේ.
(ආ) පීවිත රක්ෂණය සඳහා හානිපූර්ණ රක්ෂණ මූලධර්මය අදාළ නොවේ.
(ඉ) සන්නිවේදන ක්‍රියාවලියක යවන්නා හා ලබන්නා අතර හුවමාරුවන පණිවුඩය සම්බන්ධ කරනුයේ සන්නිවේදන මාධ්‍යය මගිනි.
(ඊ) බොහෝවිට ගමනාන්තය තෙක් යොදාගත නොහැකි වීම, දුම්රිය මාර්ග ප්‍රවාහනයේ ඇති අවාසියකි.
(ලකුණු 02 යි)

(iii) යාපනයේ අර්තාපල් වගා කරන රාජා කොළඹ සුපිරි වෙළඳසැලක් හිමි ප්‍රභාත්ට අර්තාපල් කිලෝග්‍රෑම් 50 ක් සිකුරාදා රාත්‍රී දුම්රියෙන් කොටුව දුම්රිය ස්ථානය වෙත එවන බව දුරකථනයෙන් දැනුම් දෙන ලදී. ප්‍රභාත් එම අර්තාපල් තොගය භාර ගැනීමට එකඟ වී රාජාට දන්වා තම ලොරි රථයේ රියදුරුට හා සේවකයකුට කොටුව දුම්රිය ස්ථානයට යන මෙන් දන්වන ලදී.
(අ) ඉහත සිද්ධියේ ඇතුළත් සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංගයක් වන ප්‍රතිචාරය සඳහා නිදසුනක් ලියන්න.
(ආ) ඉහත සිද්ධියේ ඇතුළත් සිල්ලර වෙළෙන්දා හා තොග වෙළෙන්දා වෙන වෙන ම නම් කරන්න.
(ලකුණු 02 යි)

(iv) ජගත් ව්‍යායාම මංතීරුවේ ඇවිදිමින් සිටිය දී රු. 500 000 ක වටිනාකමකින් යුත් හිම වැටී තිබුණු මහජන බැංකුවේ චෙක්පතක් ඇහිඳ ගනු ලැබී ය. එම චෙක්පතේ මුහුණත 'රුවන් පෙරේරා' යන නම ලියා තිබූ අතර 'ආදායකයාගේ ගිණුමට පමණයි, ලංකා බැංකුව' යන යෙදුම සමාන්තර රේඛා දෙකක් අතර ලියා තිබුණි.
(අ) මෙම චෙක්පතෙහි අණලදු සහ ආදායකයා වෙන වෙන ම නම් කරන්න.
(ආ) මෙම චෙක්පතෙහි වටිනාකම බැංකු කවුන්ටරයෙන් මුදල් කර ගැනීමට කිසිදු පාර්ශ්වයකට නොහැකි ය. ඊට හේතුව කුමක් ද?
(ලකුණු 02 යි)
(මුළු ලකුණු 08 යි)

3.

(i)

- චෙක්පත් මගින් ගෙවීම් කළ හැකිවීම
- බැංකු අයිරා පහසුකම් ලබාගත හැකිවීම
- සෘජු ප්‍රේෂණ රැස් කරවා ගත හැකිවීම
- ස්ථාවර නියෝග ක්‍රියාත්මක කළ හැකිවීම
- බැංකු ප්‍රකාශය ලැබීම

(01 × 02 - ලකුණු 02 යි)

(ii) (අ) අසත්‍යයි ✗
(ආ) සත්‍යයි ✓
(ඉ) සත්‍යයි ✓
(ඊ) සත්‍යයි ✓

(½ × 04 = ලකුණු 02 යි)

(iii) (අ) ප්‍රතිචාරය - ප්‍රභාත්, අර්තාපල් තොගය භාර ගැනීමට එකඟවීම

(ලකුණු 01 යි)

(ආ) සිල්ලර වෙළෙන්දා - ප්‍රභාත්
තොග වෙළෙන්දා - රාජා

(½ × 02 = ලකුණු 01 යි)

(iv) (අ) අණලදු - මහජන බැංකුව
ආදායකයා - රුවන් පෙරේරා

(½ × 02 - ලකුණු 01 යි)

(ආ) මෙම චෙක්පත රේඛනය කර තිබීම

(ලකුණු 01 යි)

03	(i)	(ii)				(iii)		(iv)		$\frac{08}{08}$
		අ	ආ	ඉ	ඊ	අ	ආ	අ	ආ	
	02	½	½	½	½	01	01	01	01	

4. (i) සාමාන්‍ය කොටස්වල ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) සැලසුම් කරන ලද ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමේ දී ව්‍යාපාරයේ මානව සම්පත නිසි ලෙස හැසිරවීමේ ක්‍රියාවලිය මෙහෙයවීමයි.

(ආ) ව්‍යාපාරයකට වඩාත් ආකර්ෂණීය මෙන් ම ලාභදායීව තෘප්තිමත් කළ හැකි වෙළෙඳපොළ කොටස ඉලක්ක වෙළෙඳපොළ වේ.

(ඉ) පුද්ගලයකු උපයාගත් ආදායමෙන් ඉතිරි කරගත් මුදලක්, යම් ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් ඵලදායී මාර්ගයක යෙදවීම ආයෝජනය වේ.

(ඊ) රජය වෙනුවෙන් වාණිජ බැංකු විසින් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරනු ලැබේ. (ලකුණු 02 යි)

(iii) දසුන් තම කිතුල් හකුරු නිෂ්පාදන පිටකොටුව දුම්රිය ස්ථානය අසල විශේෂ වට්ටමක් සහිත ව සේවකයින් තිදෙනෙකු සමග අලෙවි කරන අතර, එක් එක් සේවකයා ඉටු කළ යුතු කාර්ය පිළිබඳ ව උපදෙස් දෙන ලදී. ඉහත සිද්ධිය ඇසුරෙන්,

(අ) කළමනාකරණ කාර්යයක් වන මෙහෙයවීම සඳහා නිදසුනක් ලියන්න.

(ආ) අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයක් වන මිල සඳහා නිදසුනක් ලියන්න. (ලකුණු 02 යි)

(iv) අමල් සහ සමන් යන අයට ලොතරැයි දිනුමක් හිමි වී ඇති අතර ඔවුන් දෙදෙනා එය සම සමව බෙදා ගත්තා ලදී. අමල් තමාට ලද මුදලින් සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කර ඉතිරි මුදලින් ඉඩමක් මිල දී ගන්නා ලදී. සමන් තමාට ලද මුදලින් අඩක් කොළඹ කොටස් වෙළෙඳපොළේ සීමිත පොදු සමාගමක කොටස් මිල දී ගැනීමට යෙදවූ අතර ඉතිරිය ස්ථාවර තැන්පතු ගිණුමක තැන්පත් කරන ලදී.

ඉහත සිද්ධියට අදාළ ව,

(අ) ප්‍රතිලාභයක් ලෙස පොළී ආදායමක් ලබන්නේ කවුරුන් ද?

(ආ) අමල් සහ සමන් යන දෙදෙනාට ම ලැබිය හැකි ප්‍රතිලාභයේ නම කුමක් ද?

(ලකුණු 02 යි)
(මුළු ලකුණු 08 යි)

4.

(i)

- මිල දී ගත් කොටස් සඳහා ලාභාංශ ආදායම් ලැබිය හැකි වීම
- ගත්මිලට වඩා වැඩි වටිනාකමකට විකිණීමෙන් ප්‍රාග්ධන ලාභ ලැබිය හැකිවීම
- ඕනෑම අවස්ථාවක සාමාන්‍ය කොටස් අලෙවි කර මුදල් ලබා ගැනීමට හැකිවීම
- ණය ලබා ගැනීමේ දී ඇප සුරැකුම් ලෙස ඉදිරිපත් කළ හැකිවීම
- ඡන්දය භාවිත කර අධ්‍යක්ෂ මණ්ඩලය පත්කළ හැකිවීම
- අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීම මගින් සාමාගමට සම්බන්ධ තීරණ ගැනීමට දායක විය හැකිවීම

(01 × 02 = ලකුණු 02 යි)

(ii) (අ) සත්‍යයි ✓

(ආ) සත්‍යයි ✓

(ඉ) සත්‍යයි ✓

(ඊ) අසත්‍යයි ✗

(½ × 04 = ලකුණු 02 යි)

(iii) (අ) මෙහෙයවීම - එක් එක් සේවකයා ඉටුකළ යුතු කාර්ය පිළිබඳ ව උපදෙස් ලබාදීම

(ලකුණු 01 යි)

(ආ) මිල - විශේෂ වට්ටමක් සහිත ව අලෙවි කිරීම

(ලකුණු 01 යි)

(iv) (අ) සමන්

(ලකුණු 01 යි)

(ආ) ප්‍රාග්ධන ලාභ

(ලකුණු 01 යි)

04	(i)	(ii)				(iii)		(iv)		$\frac{08}{08}$
		අ	ආ	ඉ	ඊ	අ	ආ	අ	ආ	
	02	½	½	½	½	01	01	01	01	

II කොටස - ගිණුම්කරණය
(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

5. (i) ගිණුම්කරණයේ ප්‍රධානත්ව ම අරමුණ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ව්‍යාපාරයක සිදු වූ පහත සඳහන් එක් එක් ගනුදෙනුව සටහන් කිරීම සඳහා භාවිත කරන මූලාශ්‍ර ලේඛනය හා මූලික සටහන් පොත වෙන වෙන ම ලියන්න.
(අ) රු. 50 000 ක භාණ්ඩ තොගයක් අත්පිට මුදලට ගැනීම
(ආ) ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු.100 000 ක ණී බඳු ණයට ගැනීම (ලකුණු 02 යි)

(iii) රාජුගේ ව්‍යාපාරයේ 2022.01.01 දිනට මුළු වත්කම් හා මුළු වගකීම් පහත දැක්වේ.

	රු.
මෝටර් රථය	250 000
භාණ්ඩ තොගය	140 000
ණයගැතියෝ	20 000
මුදල් ශේෂය	100 000
මුළු වගකීම්	30 000

2022 ජනවාරි මාසය තුළ රාජුගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරය පහත දක්වා ඇත.

දිනය	වත්කම්				= හිමිකම +	වගකීම්
	මෝටර් රථ (රු.)	භාණ්ඩ තොගය (රු.)	ණයගැතියෝ (රු.)	මුදල් (රු.)	හිමිකම (රු.)	ණයහිමියෝ (රු.)
01/05		+ 9 000				+ 9 000
01/10				– 10 000	– 10 000 (රක්ෂණ ගාස්තු)	
01/14			– 7 000	+7 000		
01/20				– 8 000		– 8 000
01/25		– 15 000	+ 25 000		+ 10 000 (ලාභය)	

අවශ්‍ය වන්නේ : – ८००० – १५००० – ११००० ० + १०००

(අ) 2022.01.14 දින සිදු වී ඇති ගනුදෙනුව වටිනාකම් සහිතව ලියන්න.
(ආ) 2022.01.25 දිනට ව්‍යාපාරයේ හිමිකමේ වටිනාකම කොපමණ ද?
(ඉ) 2022.01.25 දිනට ව්‍යාපාරයේ මුළු ජංගම වත්කම්වල වටිනාකම කෙපෙමණ ද?
(ඊ) 2022.01.31 දින රාජුගේ ව්‍යාපාරයේ සිදු වූ පහත ගනුදෙනුව ඉහත ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න.
රාජු රු. 300 000 ක් වටිනා පෞද්ගලික මෝටර් රථය ව්‍යාපාරයට යෙදවීම (ලකුණු 04 යි)

(iv) නාරද්ගේ තොග වෙළෙඳ ව්‍යාපාරයේ 2022 ජනවාරි මාසයේ සිදු වූ විකුණුම් ගනුදෙනු පහත දැක්වේ.

2022.01.05	භාණ්ඩ තොගයක් රු. 45 000 කට චාමරට ණයට විකිණීම	(ඉන්වොයිස් අංක. 520)
2022.01.14	භාණ්ඩ තොගයක් රු. 60 000 කට අත්පිට මුදලට විකිණීම	(ලදුපත් අංක. 428)
2022.01.25	භාණ්ඩ තොගයක් රු. 100 000 කට තුවන්ට ණයට විකිණීම වෙළෙඳ වට්ටම 5%	(ඉන්වොයිස් අංක. 521)

අවශ්‍ය වන්නේ :

2022 ජනවාරි මාසය සඳහා නාරද්ගේ ව්‍යාපාරයේ,
(අ) විකුණුම් ජර්නලය
(ආ) විකුණුම් ගිණුම
(ඉ) මුළු විකුණුම් වටිනාකම

(ලකුණු 04 යි)
(මුළු ලකුණු 12 යි)

5.

(i) ව්‍යාපාරයක ඇල්මැති පාර්ශ්වවලට තීරණ ගැනීම සඳහා ප්‍රයෝජනවත් වන තොරතුරු සැපයීම වේ.

(ලකුණු 02 යි)

(ii) (අ) මූලාශ්‍ර ලේඛනය - ගෙවීම් වවුචරය
මූලික සටහන් පොත - මුදල් පොත

(½ x 02 = ලකුණු 01 යි)

(ආ) මූලාශ්‍ර ලේඛනය - ජර්නල් වවුචරය
මූලික සටහන් පොත - පොදු ජර්නලය

(½ x 02 = ලකුණු 01 යි)

(iii) (අ) රු. 7 000 ක් ණයගැතියන්ගෙන් ලැබීම **(ලකුණු 01 යි)**

(ආ) 2022.01.25 දිනට හිමිකම රු. 480 000 **(ලකුණු 01 යි)**

(ඉ) මුළු ජංගම වත්කම් = රු. 261 000 **(ලකුණු 01 යි)**

හෝ

භාණ්ඩ තොගය	රු	=	134 000
ණයගැතියෝ	රු	=	38 000
මුදල්	රු	=	89 000
		=	261 000

(අයිතම 3ක් හෝ 2ක් සඳහා ලකුණු ½ යි)

(ඊ)

දිනය	වත්කම් (රු.)				= හිමිකම් (රු.) + වගකීම් (රු.)	
	මෝටර් රථ	භාණ්ඩ තොගය	ණයගැතියෝ	මුදල්	= හිමිකම	ණය හිමියෝ
01.31	+ 300 000	-	-	-	+ 300 000	-

හෝ

වත්කම් = හිමිකම් + වගකීම් → දෙපැත්තේ එකතුව සමාන වේ.

01.31 මෝටර් රථ + 300 000 = + 300 000 -

දිනය සඳහන් කොට. **(ලකුණු 01 යි)**
වැඩිවීම් හරියාකාරව ලකුණු දැමීම.

(iv) (අ)

විකුණුම් ජර්නලය

දිනය	ඉ.අ	ගැනුම්කරු	මුළු වටිනාකම රු.	ලෙ/පි
2022.01.05	520	චාමර	45 000	½
2022.01.25	521	නුවන්	95 000	½
2022.01.31		විකුණුම් ගිණුමට බැර කළා	140 000	01

(ලකුණු 02 යි)

(ආ)

විකුණුම් ගිණුම

දිනය	විස්තරය	ස. පි.	වටිනාකම රු.	දිනය	විස්තරය	ස. පි	වටිනාකම රු.
				01.14	මුදල් ගිණුම	½	60 000
				01.31	ණයගැතියෝ	½	140 000

(ලකුණු 01 යි)

(ඉ) මුළු විකුණුම් වටිනාකම = රු. 200 000

(ලකුණු 01 යි)

05	(i)	(ii)		(iii)				(iv)			12/12
		අ	ආ	අ	ආ	ඉ	ඊ	අ	ආ	ඉ	
	02	01	01	01	01	01	01	02	01	01	

6. (i) ප්‍රාථමික පිරිවැයේ මූලිකාංග නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) නිමල් කැන්වස් රෙදිවලින් බෑග් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් 2022.01.01 දින ආරම්භ කර, ඒ සඳහා රු. 120 000 ක් වටිනා යන්ත්‍ර උපකරණ මිලට ගන්නා ලදී. ජනවාරි මාසයේ නිෂ්පාදන ව්‍යයදම් පහත දැක්වේ.

	රු.
ගොඩනැගිලි කුලී	20 000
බෑග් මසන්නන්ගේ වැටුප්	60 000
මුරකරු වැටුප	25 000
කැන්වස් රෙදි මිලට ගැනුම්	200 000
බෑග් මෝස්තර නිර්මාණ ව්‍යයදම්	30 000
විදුලි ව්‍යයදම	8 000
යන්ත්‍ර අලුත්වැඩියා ව්‍යයදම්	14 000
යන්ත්‍ර ක්ෂය	3 000

ජනවාරි මාසය අවසානයේ ඉතිරි කැන්වස් රෙදි කිසිවක් නොමැති අතර, කැන්වස් බෑගයක පිරිවැය රු.1200 කි.

අවශ්‍ය වන්නේ :

ජනවාරි මාසයේ කැන්වස් රෙදි බෑග් නිෂ්පාදනයට අදාළ,

(අ) ප්‍රාථමික පිරිවැය

(ආ) පොදුකාර්ය පිරිවැය (ලකුණු 02 යි)

(iii) කසුන්ගේ ව්‍යාපාරය විසින් 2022.01.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

	හර (රු.)	බැර (රු.)
මුදල් ශේෂය	110 000	
විකුණුම්		540 000
ගැනුම්.....	300 000	
දුරකථන ගාස්තු.....	8 000	
වරිපනම් ගාස්තු.....	2 000	
මෝටර් රථය	250 000	
ඉඩම් හා ගොඩනැගිලි	800 000	
ණයහිමියෝ		60 000
ප්‍රාග්ධනය		900 000
අවිනිශ්චිත ගිණුම	30 000	
	1 500 000	1 500 000

ඉහත ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේ දී හඳුනාගත් ගිණුම්කරණ වැරදි පහත දැක්වේ.

(අ) ගෙවූ දුරකථන ගාස්තු රු. 6 000 ක් දුරකථන ගාස්තු ගිණුමේ රු. 8 000 ක් ලෙස සටහන් කර තිබීම

(ආ) ණයහිමියන්ට ගෙවූ රු. 16 000 ක් අදාළ ණයහිමි ගිණුමට බැර කර තිබීම

(ඉ) ගෙවූ ගොඩනැගිලි අලුත්වැඩියා ව්‍යයදම් රු. 100 000 ක් ගොඩනැගිලි ගිණුමට හර කිරීම

අවශ්‍ය වන්නේ :

(අ) ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුම

(ආ) ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළ ජර්නල් සටහන් (ලකුණු 04 යි)

(iv) 2022.03.31 දිනට ගයාන්ගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ වාසිදායක ශේෂය රු. 24 000 ක් විය. නමුත් එදිනට ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය මෙයට වෙනස් විය. පසුව වෙනසට හේතු ලෙස පහත සඳහන් කරුණු අනාවරණය විය.

- බැංකුව විසින් ගයාන්ගේ ජංගම ගිණුමේ සටහන් නොකරන ලද චෙක්පත් :
  - තැන්පත් කළ නමුත් නිශ්කාෂණය නොවූ රු. 14 000 ක චෙක්පත
  - නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ රු. 15 000 ක චෙක්පත

- ගයාන්ගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සටහන් නොවූ ගනුදෙනු :
  - ස්ථාවර නියෝග මත බැංකුව ගෙවූ ණය වාරිකය රු. 10 000
  - සෘජුවම බැංකුවට ලැබූ ණයගැති ප්‍රේෂණ රු. 30 000

අවශ්‍ය වන්නේ :

(අ) 2022.03.31 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම

(ආ) 2022.03.31 දිනට ව්‍යාපාරයේ බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම (ලකුණු 04 යි)

(මුළු ලකුණු 12 යි)

6.

(i)
- සෘජු ද්‍රව්‍ය පිරිවැය
- සෘජු ශ්‍රම පිරිවැය
- වෙනත් සෘජු පිරිවැය

(ලකුණු 02 යි)
(කරුණු 02 ක් සඳහා ලකුණු 01 යි)

(ii) (අ) ප්‍රාථමික පිරිවැය

		රු.
කැන්වස් රෙදි මිලට ගැනුම්	-	200 000
බෑග් මසන්නාගේ වැටුප්	-	60 000
මෝස්තර නිර්මාණ වියදම්	-	30 000
		290 000

(ලකුණු 01 යි)
(නිවැරදි අයිතම දෙකක් සඳහා ලකුණු ½ යි)
ඉ.ල. 290 000/- නිවැරදි (01) ඉඩ.

(ආ) පොදු කාර්යය පිරිවැය

		රු.
ගොඩනැගිලි කුලී	-	20 000
මුරකරු වැටුප	-	25 000
විදුලි වියදම්	-	8 000
යන්ත්‍ර අලුත්වැඩියා	-	14 000
යන්ත්‍ර ක්ෂය	-	3 000
		70 000

(ලකුණු 01 යි)

(iii) (අ) (යෝජිතම 3 හෝ 4 ක් නිවැරදි නම් ½)
(යෝජිතම 5 නිවැරදිව සහනාධාර නිවැරදි නම් ½)

අවිනිශ්චිත ගිණුම

දිනය	විස්තරය	ස. පි.	වටිනාකම රු.	දිනය	විස්තරය	ස. පි	වටිනාකම රු.
22.01.31	ශේෂ පිරික්සුමේ වෙනස		30 000				

ශේෂය නියා නිවැරදිව ලකුණු නොවේ
T ගිණුම ඉවත්වන බව.

(ලකුණු 01 යි)

(ආ)

පොදු ජර්නලය

දිනය	ව. අ.	විස්තරය	ලෙ. පි	හර රු.	බැර රු.
(අ)		අවිනිශ්චිත ගිණුම (හර)		2 000	
		දුරකතන ගාස්තු ගිණුම			2 000
		(ගෙවූ දුරකථන ගාස්තු රු. 6 000, දුරකථන ගාස්තු ගිණුමේ රු. 8 000ක් ලෙස සටහන් වීමේ වරද නිවැරදි කිරීම)			
(ආ)		ණයහිමි ගිණුම (හර)		32 000	
		අවිනිශ්චිත ගිණුම			32 000
		(ණයහිමියන්ට ගෙවූ රු.16 000ක මුදල ණයහිමි ගිණුමට බැර කිරීමේ වරද නිවැරදි කිරීම)			
(ඉ)		ගොඩනැගිලි අලුත්වැඩියා ගිණුම (හර)		100 000	
		ගොඩනැගිලි ගිණුම			100 000
		~~(ණයහිමියන්ට ගෙවූ රු.16 000ක මුදල ණයහිමි-~~ ~~ගිණුමට බැර කිරීමේ වරද නිවැරදි කිරීම)~~			
		(ගෙවූ ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් රු. 100,000/- ගොඩනැගිලි ගිණුමට බැර කිරීමේ වරද නිවැරදි කිරීම)		134 000	134 000

(ජර්නල් සටහන් 3 සඳහා ½ x 03 - ලකුණු 01 ½ යි)
(සංලක්ෂ සටහන් 3 සඳහා ½ x 03 - ලකුණු 01 ½ යි)

(iv) (ආ)

බැංකු ගිණුම

දිනය	විස්තරය	ස. පි.	වටිනාකම රු.	දිනය	විස්තරය	ස. පි	වටිනාකම රු.
22.03.31	ශේෂය ඉ/ගෙ		24 000 ½		ණය වාරිකය		10 000 ½
	ණයගැති ප්‍රේෂණ		30 000 ½	22.03.31	ශේෂය ප/ගෙ		44 000 ½
			54 000				54 000
22.04.01	ශේෂය ඉ/ගෙ		44 000				

(ලකුණු 02 යි)

(ආ)

2022 මාර්තු මාසය සඳහා

බැංකු සැසඳුම් විස්තරය

	රු.	රු.	
බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය		44 000	½
එකතු කළා :-			
නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකල චෙක්පත්	15 000	15 000	½
		59 000	
අඩු කළා :-			
තැන්පත් කළ නමුත් නිශ්කාෂණය නොවූ චෙක්පත්	14 000	(14 000)	½
2022.03.31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය		45 000	½

(ලකුණු 02 යි)

06	(i)	(ii)		(iii)		(iv)		$\frac{12}{12}$
		අ	අ	ආ	ආ	අ	ආ	
	02	01	01	01	03	02	02	

7. (i) ලාභ අරමුණු කර නොගත් සංවිධානයක පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශන දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශක්ති ක්‍රීඩා සමාජයේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දෝෂ සහිතව පිළියෙල කළ ආදායම් ප්‍රකාශය පහත දැක්වේ.

	රු.	රු.
ආදායම්		
සාමාජික ගාස්තු	18 000	
පරිත්‍යාග ලැබීම්	10 000	28 000
වියදම්		
ක්‍රීඩා තරග සඳහා වියදම්	8 000	
විදුලි බිල් ගාස්තු	1 500	
ප්‍රවේශ පත්‍ර ආදායම්	10 000	(19 500)
ශුද්ධ ලාභය		8 500

අමතර තොරතුරු :

- මෙම ක්‍රීඩා සමාජයේ සාමාජිකයින් ගණන 100 කි.
- එක් අයෙකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 200 කි.
- රු. 5 000 කට මිලට ගෙන ඇති ක්‍රීඩා උපකරණ වාර්ෂිකව 10% බැගින් ක්ෂය කිරීමට තීරණය කර ඇත.

අවශ්‍ය වන්නේ :

ශක්ති ක්‍රීඩා සමාජයේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිවැරදි ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම. (ලකුණු 02 යි)

(iii) නිර්මලාගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට ශේෂ පිරික්සුම් පහත දැක්වේ.

	ඉර (රු.)	බැර (රු.)
විකුණුම්		800 000
ගැනුම්	375 000	
ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැයට)	500 000	
මෝටර් රථ (පිරිවැයට)	600 000	
ණයගැතියෝ	9 000	
ණයහිමියෝ		15 000
ගොඩනැගිලි කුලී	18 000	
ලද වට්ටම්		5 000
දුන් වට්ටම්	2 000	
විකුණුම් සේවක වේතන	8 000	
බැංකු ගාස්තු	1 500	
විදුලි ගාස්තු	2 500	
10% බැංකු ණය		100 000
ප්‍රාග්ධනය 2021.01.01 දිනට		624 000
ගෙනඒමේ කුලී	10 000	
තොගය 2021.01.01 දිනට	15 000	
මුදල් ශේෂය	3 000	
	1 544 000	1 544 000

අමතර තොරතුරු :

- 2021.12.31 දිනට ඉතිරි තොගයේ පිරිවැය රු. 20 000 කි.
- 2021.12.31 දිනට ගෙවිය යුතු ගොඩනැගිලි කුලිය රු. 2000 කි.
- මෝටර් රථ සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 20% බැගින් ක්ෂය කළ යුතු ය.

අවශ්‍ය වන්නේ :

(අ) 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ලකුණු 04 යි)

(ආ) 2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 04 යි)

(මුළු ලකුණු 12 යි)

7.

(i)
- ලැබීම් හා ගෙවීම් ගිණුම
- ආදායම් ප්‍රකාශය / ආදායම් හා වියදම් ගිණුම
- වුලා නන්ද පුනගෑස්

02

(01 × 02 - ලකුණු 02 යි)

(ii)

ශක්ති ක්‍රීඩා සමාජය
2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ආදායම් ප්‍රකාශනය

	රු.	රු.
ආදායම්		
සාමාජික ගාස්තු	20 000	
පරිත්‍යාග ලැබීම්	10 000	
ප්‍රවේශ පත්‍ර ආදායම	10 000	40 000
වියදම්		
ක්‍රීඩා තරග සඳහා වියදම	8 000	
විදුලි බිල් ගාස්තු	1 500	
ක්‍රීඩා උපකරණ ක්ෂය	500	(10 000)
අතිරික්තය		30 000

(ලකුණු 02 යි)

04 (iii) (අ)

නිර්මලාගේ ව්‍යාපාරය

2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ලාභ හෝ අලාභ ප්‍රකාශය ½

	රු.	රු.		රු.	රු.
2021.01.01 තොගය		15 000	විකුණුම්		800 000
එකතු කළා : ගැනුම්	375 000				
ගෙනඒමේ කුලි	10 000	385 000			
විකිණීමට ඉ.ක. භා. පිරිවැය		400 000			
අඩු කළා : 2021.12.31 තොගය		(20 000) ½			
විකුණුම් පිරිවැය		380 000 ½			
දළ ලාභය ප/ගෙ		420 000 ½			
		800 000			800 000
බෙදාහැරීමේ වියදම් :-			දළ ලාභය ඉ/ගෙ		420 000
දුන් වට්ටම්	2 000		වෙනත් ආදායම් :		
විකුණුම් සේවක වේතන	8 000		ලද වට්ටම්		5 000
මෝටර් රථ ක්ෂය	120 000 ½	130 000			
පරිපාලන වියදම් :-					
ගොඩනැගිලි කුලී	20 000 ½				
විදුලි ගාස්තු	2 500	22 500			
මූල්‍ය භා වෙනත් වියදම් :-					
බැංකු ගාස්තු	1 500				
බැංකු ණය පොළී	10 000 ½	11 500			
ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට බැර කළා		261 000	½ නිවැරදි භාවය		
		425 000			425 000

* නිවැරදි වියදම් වර්ගීකරණය යටතේ නම් පමණි.

(ලකුණු 04 යි)

(ආ)

නිර්මලාගේ ව්‍යාපාරය
2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ½

½

	රු.	රු.	ජංගම නොවන වත්කම්	පිරිවැය රු.	සමුච්චිත ක්ෂය රු.	ධාරණ අගය රු.
ප්‍රාග්ධනය 2021.1.1	624 000		ඉඩම් හා ගොඩනැගිලි	500 000	-	500 000
එකතු කලා -			මෝටර් රථ	600 000	120 000 ½	480 000
ශුද්ධ ලාභය ½	261 000	(දෙ අගය)		1 100 000	120 000 ½	980 000
		885 000				
ජංගම නොවන වගකීම්			ජංගම වත්කම්			
10% බැංකු ණය		100 000	2021.12.31 දිනට තොගය		20 000 ½	
			ණයගැතියෝ		9 000	
ජංගම වගකීම්			මුදල්		3 000	32 000
ණයහිමියෝ	15 000					
උප. ගොඩ. කුලිය	2 000 ½					
උප. බැ. ණය පොලිය	10 000 ½	27 000				
		1 012 000				1 012 000

(ලකුණු 04 යි)

(iii) (අ)

නිර්මලාගේ ව්‍යාපාරය
2021.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා
ලාභ හෝ අලාභ ප්‍රකාශනය ½

	රු.	රු.	රු.
විකුණුම්			
අඩුකළා - විකුණුම් පිරිවැය :			800 000
2021.01.01 දිනට තොගය		15 000	
එකතු කළා - ගැනුම්	375 000		
ගෙන ඒමේ කුලී	10 000	385 000	
විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩ තොගයේ පිරිවැය		400 000	
අඩුකළා - 2021.12.31 දිනට ඉතිරි තොගය		½ (20 000)	½
විකුණුම් පිරිවැය			(380 000)
දළ ලාභය			420 000 ½
වෙනත් ආදායම් :			
ලද වට්ටම්		5 000	5 000
			425 000
අඩුකලා වියදම් :			
බෙදාහැරීමේ වියදම් :			
දුන් වට්ටම්	2 000		
විකුණුම් සේවක වේතන	8 000		
මෝටර් රථ ක්ෂය	120 000	½ 130 000	
පරිපාලන වියදම් :			
ගොඩනැගිලි කුලි	20 000	½	
විදුලි ගාස්තු	2 500	22 500	
මූල්‍ය හා වෙනත් වියදම් :			
බැංකු ගාස්තු	1 500		
බැංකු ණය පොළී	10 000	½ 11 500	(164 000)
ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට ගෙන ගියා	½		261 000

(ලකුණු 04 යි)

(ආ)

නිර්මලාගේ ව්‍යාපාරය
2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ½

ජංගම නොවන වත්කම් :	පිරිවැය රු.	සමුච්චිත ක්ෂය රු.	ධාරණ අගය රු. ½
ඉඩම් සහ ගොඩනැගිලි	500 000	-	500 000
මෝටර් රථ	600 000	120 000	½ 480 000 ½
	1 100 000	120 000	½ 980 000 ½
ජංගම වත්කම්			
2021.12.31 දිනට තොගය		20 000 ½	
ණයගැතියෝ		9 000	
මුදල්		3 000	32 000
මුළු වත්කම්			1 012 000
2021.01.01 ප්‍රාග්ධනය		624 000	
එකතු කළා - ශුද්ධ ලාභය (අලාභය)	½	261 000	885 000
ජංගම නොවන වගකීම් :			
10% බැංකු ණය			100 000
ජංගම වගකීම්			
ණයහිමියෝ		15 000	
උපචිත ගොඩනැගිලි කුලී		2 000 ½	
උපචිත බැංකු ණය පොලී		10 000 ½	27 000
මුළු හිමිකම් හා වගකීම්			1 012 000

(ලකුණු 04 යි)

07	(i)	(ii)	(iii)		12/12
			අ	ආ	
	02	02	04	04	

****